**ශීර්ෂය 115 - බලශක්ති අමාත්‍යාංශය**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

බලශක්ති අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුලි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බලශක්ති අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයේ මහා මාර්ග, මාර්ග සංවර්ධන හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ බලශක්ති අමාත්‍යාංශය යටතේය. ඒ අනුව අමාත්‍යාංශයේ විෂය පථය වෙනස් වී තිබූ බැවින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයට අනුරූප බව ප්‍රකාශ කළ නොහැක.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 1.6.1 ආදායම් නොවන ලැබීම්

--------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හා 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශයන්හි 3 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන 2020 වසරට අදාළ අවසාන ගිණුම් ප්‍රකාශන සහ ඊට අමුණා ඉදිරිපත් කෙරෙන වගුවල අන්තර්ගත සංඛ්‍යා පදනම් කරගනිමින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වේ. එසේ වුවද. භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම් යටතේ ගැනෙන රු. 13,846,568ක් වූ අත්තිකාරම් ලැබීම් රු. 12,796,742ක් ලෙස දැක්වීම හේතුවෙන් අත්තිකාරම් ලැබීම රු. 1,049,826 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | භාණ්ඩාගාරික මුද්‍රිත සටහනට අනුව නිවැරදි කර වාර්තාව ඉදිරිපත් කරමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 හි විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| **(ආ)** භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ප්‍රධාන ලෙජර වියදම් යටතේ ගැනෙන අත්තිකාරම් ගෙවීම් ශේෂය රු. 25,630,728ක් වුවද, එය රු. 24,519,548 ක් ලෙස දැක්වීම හේතුවෙන් අත්තිකාරම් ගෙවීම රු. 1,111,180 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

## 1.6.2 පුනරාවර්තන හා මූලධන වියදම්

-------------------------------------

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා දරන ලද රු.49,100,887 ක වියදම රු. 49,878,954 ක් ලෙසත්, සහනාධාර සහ මාරුකිරීම් සඳහා ගෙවන ලද රු.29,446,707 ක වියදම රු.29,731,379 ක් ලෙසත් දක්වා තිබුණි. ඒ අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සහ සහනාධාර සහ මාරුකිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් මුදල් ගලායෑම් යටතේ පිළිවෙලින් රු. 778,067 කින් සහ රු. 284,672 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශ දෙකක් යටතේ කටයුතු කිරීමට සිදුවූ බැවින් මුළු වර්ෂයටම අදාල වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා තිබූ අතර එම වරදවල් නිවැරදි කොට 2020.09.01 සිට 2020.12.31 දක්වා කාලපරිච්ඡේදයට අදාල සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත. 2020.08.31 දක්වා දරන ලද වියදම් අක්මුදල් ගැලපුම් ගිණුමෙහි වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් දරණ ලද මුදල් යටතේ ගැලපුම් කර පෙන්වා තිබේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 හි විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. |
| (ආ) | භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් සඳහා දරන ලද රු. 1,722,968 ක් වූ වියදම සමාලෝචිත වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ රු. 1,594,418 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන කටයුතුවලින් ජනිතවූ මුදල් ගලායාම රු. 128,550 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

## 1.6.3 දේපල පිරියත හා උපකරණ

---------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට අනුව මූලධන වියදම් යටතේ රු.1,857,004 ක වත්කම් අත්පත් කරගෙන තිබුණ ද මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනයට හා මූල්‍ය නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශය (ACA- 6) ට අනුව සමාලෝචිත වර්ෂ | පසුගිය වසරේ ශීර්ෂ කිහිපයක් යටතේ ගිණුම් ගතකළ අතර අවස්ථාවේ රු. 1,857,004 ක මුදල අතපසුවීමකින් CIGAS මෘදුකාංගයේ වත්කම් යටතේ අතුලත් කර නොමැත. එකී මුදල මෙම වර්ෂයේ දී ගිණුම් ගතකරන බව දන්වා | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 හි විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| අවසානයට දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු. 292,942,595 ක් ලෙස වර්ෂය ආරම්භයේ පැවති ශේෂයම දක්වා තිබුණි. එසේම මූල්‍ය ප්‍රකාශනයේ මේ පිළිබඳව කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | සිටිමි. | |

**1.6.4 අක් මුදල් ගැලැපුම් ගිණුම**

------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හා 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශයන්හි 7(vi) ඡේදය ප්‍රකාරව පිළියෙල කරන ලද අක්මුදල් ගැලපුම් ගිණුමේ හර කළ යුතු අත්තිකාරම් ශේෂය රු. 23,806,925 ක් වුවද එය රු. 22,695,746 ක් ලෙස රු. 1,111,180 කින් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාරික මුද්‍රිත සටහනට අනුව නිවැරදි අගය අක් මුදල් ගැලපුම් ගිණුමට ගලපා නිවැරදි කර ඉදිරිපත් කරමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 හි විධිවිධාන අනුව කටයුතු කළ යුතුවීම. |
| (ආ) තවද ඉහත චක්‍රලේඛය අනුව අක්මුදල් ගැලපුම් ගිණුමේ බැර කළ යුතු අත්තිකාරම් ශේෂය රු. 12,021,919 ක් වුවද එය රු. 10,972,093 ක් ලෙස රු. 1,049,826 කින් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාරික මුද්‍රිත සටහනට අනුව නිවැරදි අගය අක් මුදල් ගැලපුම් ගිණුමට ගලපා නිවැරදි කර ඉදිරිපත් කරමි. | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 ආදායම් කළමනාකරණය**

----------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ ඇස්තමේන්තු ආදායම 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 6ක් අඩුවෙන්ද 2020 වර්ෂයේදී එය තව දුරටත් සියයට 6කින් අඩුවෙන්ද ඇස්තමේන්තු කර තිබුණි. | මෙම අමාත්‍යාංශය විසින් තාර හා නැව් තෙල් ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ දී 2018 වර්ෂය තුළ තාර ආනයන බලපත්‍ර 19 | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙළ කල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | එසේ උවද 2019 වර්ෂයේ සත්‍ය ආදායම 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 0.05ක් අඩුවෙන් ලැබී තිබූ අතර 2020 වර්ෂයේදී එය තව දුරටත් සියයට 8කින් අඩුවී තිබුණි. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ඔක්තෝබර් 25 දිනැති ලිපිය මගින් නැව් තෙල් ව්‍යාපාරයේ නියැලෙන ව්‍යාපාරිකයන්ගේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව 2019 වර්ෂයේ සිට ඇමෙරිකානු ඩොලර් 1,000 සිට 5,000 දක්වා ඉහ දමා තිබියදීත් ඇස්තමේන්තු ආදායම හා සත්‍ය ආදායම අඩුවී තිබුණි. | ක් ද 2019 දී 10 ක් ද නිකුත් කර ඇත. ඒ අනුව 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වීම හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම අඩු වී ඇත. එසේම රට තුළ උද්ගතව පවතින කොවිඩ් වසංගත තත්ත්වය මගින් ආර්ථිකයට ඇති කර ඇති සෘජු බලපෑමත් ඇස්තමේන්තු කළ ආදායමට වඩා සත්‍ය ආදායම අඩුවීමට හේතු වී ඇත. | |
| (ආ) | තවද, 2020 වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 128.8ක් වූ අතර, පසුව එය රුපියල් මිලියන 115.8ක් දක්වා එනම් සියයට 10 කින් අඩුකර සංශෝධනය කර තිබුණි. ඒ අනුව, මූලික ඇස්තමේන්තුව සමග සැසදීමේදී සත්‍ය ආදායම අඩුවීම සියයට දහය ඉක්මවා තිබුණි. | ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි ඉකුත් වර්ෂ දෙකෙහි ඇස්තමේන්තුගත ආදායම සත්‍ය ආදායම් සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ ආදායම යම් ප්‍රමාණයකට අඩු වීමක් සිදුව ඇති බව පිළිගන්නා අතර, ඉදිරියේදී ඒ හා සම්බන්ධයෙන් අවධානය යොමු කෙරෙනු ඇත. | -එම- |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බලශක්ති අමාත්‍යාංශයේ, අමාත්‍ය කාර්යාලය හා අමාත්‍යාංශ පරිපාලන හා ආයතනික සේවා ව්‍යාපෘතිවල වැය විෂයයන් 19 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 100 අතර ප්‍රමාණයක් වෙනත් වැය විෂයන්ට මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විදේශ සංචාර සඳහා සහභාගී නොවීම, සීමා සහිතව වැඩ කිරීම නිසා වියදම් අවමවීම, සමුළු නොපැවැත්වීම නිසා සංග්‍රහ වියදම් අවම වීම, යන්ත්‍ර උපකරණ දෝෂ අවම වීම, ගොඩනැගිලි ඉදිකිරීම් නඩත්තු වියදම් අවමවීම, තැපැල් වියදම් අවමවීම බදුකුලී බිල් ඉදිරිපත් නොවීම, ජල බිල්පත් ඉදිරිපත් නොවීම, මෙහෙයුම් කල්බදු වාරික ඇස්තමේන්තු වියදමට වඩා අඩුවීම, විශ්‍රාම ප්‍රතිලාභ ලබන සේවකයන් නොසිටීම උපකරණ මිලදී නොගැනීම යනාදී කරුණු නිසා වියදම් අවමවීම නිසා වියදම් අවම වීම. | මුදල් රෙගුලාසි 50 II ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී, ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙළ කිරීමට සඳහා උපරිම ප්‍රයත්න දැරිය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍ය කාර්යාලය හා අමාත්‍යාංශ පරිපාලන හා ආයතනික සේවා ව්‍යාපෘතිවල වැය විෂයයන් 16 ක් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය මෙන් සියයට 10 සිට 285 අතර ප්‍රමාණයක් වෙනත් වැය විෂයයන්ගෙන්, මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකර තිබුණි. | ඇතැම් තනතුරු සඳහා වැටුප්තල වෙනස්වීම, අතිකාල වියදම් වැඩිවීම සේවක සංඛ්‍යාව වෙනස්වීම ඉන්ධන වියදම් වැඩිවීම, ඇමතිතුමාගේ ආරාධිතයින් වැඩිවීම, වාහන නඩත්තු වියදම් වැඩිවීම භාෂා පරිවර්තවන දීමනා වැඩිවීම, උපකරණ මිලදී ගැනීම, කාර්යාලිය ලිපි මිලදී ගැනීම, වාහන නඩත්තු වියදම් ඉහල යාම, යන්ත්‍ර නඩත්තු වියදම් ඉහල යාම, ගොඩනැගිලි නවීකරණ වියදම් වැඩිවීම, අන්තර්ජාල විදුලි වියදම් වැඩිවීම, පුනරාවර්තන වියදම් ඉහල යාම, කාර්යාල උපකරණ මිලදී ගැනීම යනාදී වියදම් ඇස්තමේන්තු වියදම වඩා වැඩිවීම. | -එම- |
| (ඇ) | වැය විෂයයන් 03 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 100 ද තවත් වැය විෂයයන් 06 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 සිට සියයට 65 දක්වා ප්‍රමාණයක්ද උපයෝජනය නොකර ඉතිරි වී ඇති බව නිරීක්ෂණය වේ. | බාහිර පාර්ශවයන් පැමිණීම සීමාවීම, වාහන නඩත්තු වියදම් අඩුවීම, උපකරණ මිලදී ගැනීම සීමාවීම, කාර්යාල උපකරණ මිලදී ගැනීම සීමාවීම, ව්‍යාපෘති වැඩසටහන් සීමාවීම යනාදී කරුණු නිසා ඇස්තමේන්තු වියදම් ඉතිරිවීම. | -එම- |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේදී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊළග වර්ෂය තුල නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවටත්, එම උපදෙස්වලට ඇතිකර ගන්නා වගකීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් ලබා දී තිබුණි. එසේ උවද මූල්‍ය ප්‍රකාශන සටහන iii බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව, කාලච්ඡේද අවසානයේ බැදීම් හා බැරකම් ප්‍රමාණය රු. 60,422 ක් වුවද, රු. 398,356 ක් දක්වා බැදීම්වලට එළැඹ තිබු බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන සටහන iii බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව කාලච්ඡේද අවසානයේ බැදීම් හා බැරකම් ප්‍රමාණය රු. 60,422 ක් වුවද එය අතපසු වීමකින් රු. 398,356 ක් ලෙස සටහන් වී ඇති අතර ඉදිරියේදී නියමාකාරයෙන් ගිණුම් සටහන් තැබීමට කටයුතු කරන බව සඳහන් කරමි. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුවීම. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව විස්තර ලැබෙන තෙක් තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල්, ඉකුත්වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා, අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ අදායමට හෝ බැර කළ යුතුය. නැතහොත් හැකි ඉක්මනින් ආපසු ගෙවිය යුතුය. එසේ වුවද, අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යවරයෙකුට නිකුත් කර තිබූ වට්ටෝරු භාණ්ඩ නැවත භාර නොදීම හේතුවෙන් එකී අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම්ගේ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් ප්‍රධානය වන රු. 233,366 ක මුදල 2015 දෙසැම්බර් 17 වන දින පොදු තැන්පතු ගිණුමේ රඳවා සමාලෝචිත වර්ෂය අවසානයේදී ද මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකර ඉකුත්වූ තැන්පතුවක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | මෙම කාර්යයට අදාලව ඉදිරි ක්‍රියාමාර්ග සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටු නිර්දේශයට අනුව මෙම කාර්යය කඩිනමින් අවසන් කරන බව ප්‍රකාශ කරමි. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කල යුතුවීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ 2012 වර්ෂයේ සිට සේවය අතහැර ගොස් ඇති සේවකයෙකුගේ රු. 67,884ක හිග ආපදා ණය ශේෂය වසර අටක් ගතවී තිබුණද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ 01 ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම පුද්ගලයාගෙන් ණය මුදල් අය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇති බව තහවුරු වී ඇත. ණයකරු දැනට පත් වී සිටින තත්ත්වය ගරු අධිකරණ වෙත වාර්තා කර ඇති අතර ගරු අධිකරණයෙන් ලැබෙන තීරණය මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කරමින් කලයුතු කලයුතු වීම. |

**3.2** **පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදිරිපත් කරණ ලද මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් පොත් වලින් කපාහැරීම පිළිබද ප්‍රකාශය තුළ 2020 දෙසැම්බර් 31 දිනට කපා නොහල ඉදිරියට ගෙන යන පාඩු හා අත්හැරීම් වශයෙන් එකතුව රු, 1,064,226ක් වූ රිය අනතුරු 17ක් වාර්තා කර තිබුණි. එම රිය අනතුරු සිදුවී අවම වශයෙන් වසර 3 ක කාලයක් ඉක්ම වී තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර පාඩුව ආපසු අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා පිළියෙළ කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය යටතේ රු. 25,000 ට අඩු වටිනාකමින් යුතු සිදුවීම් 12 ක් වාර්තා වී ඇති අතර මෙම සිදුවීම් 12 සම්බන්ධයෙන් පරික්ෂාකර බලා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය යටතේ පොත්වලින් කපාහැරීමට හැකියාවක් පවතී නම් එසේ සිදු කිරීමටත්, රු. 25,000 ට වැඩි හානි සම්බන්ධයෙන් වූ සිද්ධි 05 සඳහා ඉදිරියේදී පරික්ෂාකර බලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බවක් දන්වා සිටිමි. | ක්‍රමවේදයන්, මාර්ගෝපදේශ හා චක්‍රලේඛය විධිවිධාන අනුගමනය කරමින් කලයුතු කලයුතු වීම |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේදී අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 87 දෙනෙකුගෙන් සමන්විත වූ අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 72ක් විය. ඒ අනුව ජේෂ්ඨ මට්ටමේ නිලධාරින් 06ක් ඇතුළුව පුරප්පාඩු 15ක් පැවතුණි. | 87 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලය අත්‍යවශ්‍ය කාර්යය මණ්ඩලයක් වන අතර, ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීමේ හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇත. අමාත්‍යාංශය ඉඩකඩ සහිත වෙනත් ස්ථානයකට රැගෙන යාමට සුදුසු ස්ථානයක් සොයා බලමින් පවතින අතර නුදුරේදීම වෙනත් ස්ථානයක ස්ථානගත වීමෙන් පසුව මෙම ගැටලුව නිරාකරණය කරනු ඇත. | කාර්යයමණ්ඩල ඌනතාවය අමාත්‍යාංශයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොවේ නම් කාර්යය මණ්ඩල සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුවීම. |